# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 62/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திகதி<br>Date | 14/01/2024<br>පැය1110 | | |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. රැඳවුම් නියෝග මත රඳවා සිටි සැකකරුවෙකුගෙන් අනාවරණය වූ කරුණු මත හෙරොයින් සහ කේරළ ගංජා සමඟ තවත් සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පල්ලෙකැලේ පොලිස් ස්ථානය.**

2024.01.12 වන දින පල්ලෙකැලේ පොලිස් වසමේදී හෙරොයින් ග්‍රෑම් 48 මිලිග්‍රෑම් 140 ක් සමඟ අත්අඩංගුවට ගත් සැකකරුවෙකු අධිකරණය වෙත ඉදිරිපත් කර රැඳවුම් නියෝග මත පල්ලෙකැලේ පොලිස් ස්ථානය විමර්ශන සිදුකරමින් සිටියදී, එම සැකකරුගෙන් අනාවරණය වූ තොරතුරු මත වැල්ලම්පිටිය පොලිස් වසමේ කොටිකාවත්ත ප්‍රදේශයේ පිහිටි ගරාජයක මත්ද්‍රව්‍ය සඟවා ඇති බවට අනාවරණය වී ඇත.

අනතුරුව පල්ලෙකැලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් එම ස්ථානයේ වැටලීමක් සිදුකර සැකකරු විසින් සඟවා තිබූ **හෙරොයින් ග්‍රෑම් 50 ක් සහ කේරළ ගංජා කිලෝ 29 ග්‍රෑම් 425 ක් පොලීසිය විසින් සොයා** ගෙන ඇත. පසුව ගරාජයේ සිටි තවත් පුද්ගලයන් තිදෙනෙකු පරීක්ෂාවට ලක් කර ඇති අතර, ඉන් එක් සැකකරුවෙකු සන්තකයේ තිබී **කේරළ ගංජා කිලෝ 03 ග්‍රෑම් 875 ක්** සමඟ අත්අඩංගුවට ගෙන ඇති අතර, අනෙක් සැකකරුවන් දෙදෙනා සන්තකයේ තිබී පිළිවෙලින් **හෙරොයින් මිලිග්‍රෑම් 70 ක්** සහ **හෙරොයින් මිලිග්‍රෑම් 60 ක්** සොයා ගෙන ඇත.

**කේරළ ගංජා සමඟ අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන ඉමදුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර, හෙරොයින් සමඟ අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 27 හා 60 වයස්වල පසුවන ගොතටුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පල්ලෙකැලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. වන අලි ප්‍රහාරයක් හේතුවෙන් පුද්ගලයෙකු මියයාමක් - පුලියන්කුලම පොලිස් වසම.**

2024.01.13 වන දින රාත්‍රී කාලයේ පුල්යන්කුලම පොලිස් වසමේ සින්නපුරසන්කුලම් ප්‍රදේශයේදී යතුරු පැදියකින් ගමන් කරමින් සිටියදී වන අලි ප්‍රහාරයක් හේතුවෙන් මියගොස් ඇති බවට පුලියන්කුලම පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වන වෙල්ලන්කුලම, නෙඳුන්කේනි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නෙඳුන්කේනි රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පුලියන්කුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. වන අලියෙකු පහරදීමෙන් පුද්ගලයෙකු මියයාමක් - සූරියවැව පොලිස් වසම.

2024.01.13 වන දින රාත්‍රී කාලයේ සූරියවැව පොලිස් වසමේ කුඩාඉදිවැව, කැබැල්ලගල රක්ෂිත ප්‍රදේශයේදී වන අලියෙකු පහරදීමෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට සූරියවැව පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ වැකඳවර, වීරකැටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් පුද්ගලයින් දෙදෙනෙකු සමඟ රක්ෂිත ප්‍රදේශයේ වගා කටයුතු සිදුකර ඇති අතර තිදෙනාම වගාවේ වාඩියක සිටියදී වන අලියෙකු පැමිණ මරණකරුට පහරදී ඇති අතර අනෙක් දෙදෙනා දිවගොස් දිවි බේරාගෙන ඇති බව විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය හම්බන්තොට රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සූරියවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - ගල්ගමුව පොලිස් වසම.

2024.01.13 වන දින දහවල් කාලයේ ගල්ගමුව පොලිස් වසමේ බුදුරුවකන්ද වේරබැදියාව මාර්ගයේ වැල්පොතුවැව ප්‍රදේශයේදී බුදුරුවකන්ද දෙස සිට වේරබැදිවැව දෙසට ධාවනය වූ යතුරුපැදියක, අතුරු මාර්ගයකින් එක්වරම ප්‍රධාන මාර්ගයට පැමිණි පාපැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පාපැදිකරු සහ යතුරුපැදිකරු ගල්ගමුව රෝහලට ඇතුලත් කර පාපැදිකරු වැඩිදුර ප්‍රථිකාර සඳහා අනුරාධපුර රෝහල වෙත මාරු කර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 80 ක් වන වැල්පොතුවැව, ගල්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ගල්ගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.